ක්‍රියාකාරකම: 7.2.1- ප්‍රාග් ඓතිහාසික සිතුවම් අගයමු.

කියවීමේ පත්‍රිකාව:

- දුවේ පුතේ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් ලෙස සැලකෙන නිර්මාණ වැඩි වශයෙන් හමුවන්නෙ උතුරු මැද හා නැගෙනහිර ප්‍රදේශ ආශ්‍රිතවයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව වසර දෙලක්ෂ පනස් දහසක් තරම් ඉපැරණි මානව හා ශිලා මෙවලම් සාධක හමුවේ.
- මහාචාර්ය ඩී.බී. නන්දදේව සහ මහාචාර්ය ඊ.පී. දැරණියගල අනුමාන කරන පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර වසර තුන්දහසක් තරම් ඉපැරණි වේ.
- ප්‍රාග් ඓතිහාසික සිතුවම් වැදි ජනතාව විසින් අඳින ලද නිර්මාණ වශයෙන් සෙලිග්මාන් විසින් හඳුන්වා දී ඇත.
- ආදි මිනිසා ගල් ගුහාවල, ගස් බෙනවල, හා මහා වනාන්තරවල ආරක්ෂිත ස්ථානවල ජීවත් වූ අතර දඩයම ප්‍රධාන ජීවනෝපාය විය.
- එම නිසා මෙම සිතුවම් වලට වස්තු විෂය වී ඇත්තේ මිනිසුන් සහ සතුන් ය.
- අලියා, දිවියා, සිංහයා, කිඹුලා, මුවා, ගෝනා, වඳුරා, තලගොයා සහ මොනරා ප්‍රධාන සත්ත්ව රූප සටහන් වේ.

**ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල පොදු ලක්ෂණ**

- චිත්‍ර ඇඳීමේදී භාවිතා වූ ප්‍රධාන ශිල්පක්‍රම
    1. රේඛාමය සටහන් ඇඳීමේ ශිල්ප ක්‍රම
    2. ලී කැබැල්ලකින් හෝ ඇඟිල්ලෙන් සායම් තැවරීමේ ක්‍රමය
    3. සීරීමෙන් මතු කිරීමේ ක්‍රමය (Engraving)
- අඟුරු, කිරිමැටි, සත්ත්ව ලේ, හිරිගල් යනා දී ස්වාභාවික ද්‍රව්‍ය වර්ණ ලෙස යොදා ගෙන ඇති අතර වතුර, මැලියම් හෝ සත්ත්ව ලේ සමඟ ඒවා මිශ්‍ර කර ඇත.
- තනි රූප හා යුගල රූප සම්පිණ්ඩනයන් ලෙස චිත්‍ර නිර්මාණ කර ඇත.
- සරල හැඩතල භාවිතයෙන් රූප සංකේතාත්මක ව ඇඳ තිබීම.
- මිනිස් හා සත්ත්ව රූපවලට අමතරව වෙනත් ජ්‍යාමිතික හැඩ හා සංකේත රූප යොදා ගැනීම.

ප්‍රාග් ඓතිහාසික සිතුවම් දැකිය හැකි ගල් ගුහා කිහිපයක් පහත දැක්වේ.

1. තන්තිරිමලේ ගුහාව
2. දොරවක ගුහාව

3. බිල්ලෑව ගුහාව

මෙම ගල් ගුහා තුන පිළිබඳව වෙන වෙනම දැන ගනිමු.

**තන්තිරිමලේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්**

- ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වේ.
- මෙම නිර්මාණ අතර දුනුවායා හා සතෙකුගේ පිට යන මිනිස් රුවත්, කණ්ඩායම් සම්පිණ්ඩනය/කොටුවක් (නිවසක්) තුළ සිටින මිනිසr් ඌප සහිත චිත්‍රයත් වැදගත් නිර්මාණ ලෙස සැලකේ.
- තල්ගොයෙකු ලෙස අනුමාන කරන රූපසටහන සත්ත්ව රූප අතුරින් විශේෂ වේ.



සතකුගේ පිට මත මිනිසා



පිටපත් කරන ලද සතකුගේ පිට මත මිනිසා සිතුවම



තලගොයා



දුනුවායා



පිටපත් කරන ලද දුනුවායා සිතුවම



කණ්ඩායම් සම්පිණ්ඩනය/ කොටුවක් තුළ ඇති (නිවසක්) මිනිස් රූප



තන්තිරිමලේ ලෙන



මිනිස් සහ සත්ත්ව රූප

**දොරවක ප්‍රාග් ඓතිහාසික සිතුවම්**

- කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළයේ වරකාපොළට නුදුරු මල්දෙනිය වතුයයේ පිහිටා ඇත.
- එකකින් අනෙක දරා සිටින සේ අඩි 1500 ක් පමණ උස විශාල ගල්පර්වත දෙකකින් සැදුණු ස්වාභාවික ගල් දෙකකි.
- ජී. එෆ්. ආර්. බ්‍රොහියර් විසින් 1919 දීසොයා ගන්න ලදී.
- මෙම ලෙනෙහි චිත්‍ර නිර්මාණය කර ඇත්තේ පොළොවේ සිට අඩි 6 ½ ක් පමණ උසකිනි.
- රේඛා හා සීරීම යන ක්‍රම දෙකට ම අඳින ලද චිත්‍ර දක්නට ලැබේ.
- මෙම ලෙනෙහි දක්නට ලැබෙන චිත්‍ර අතුරින් ඇතා සහ පැටවා චිත්‍රය විශිෂ්ට නිර්මාණයක් වශයෙන් හැඳින්වේ.
- මාළුවා සහ මිනිස් රුව, තලගොයා නැමැති රූපද වැදගත් නිර්මාණ ලෙස සැලකේ.



ඇතා සහ පැටවා



පිටපත් කරන ලද
ඇතා සහ පැටවා සිතුවම



මාළුවා සහ මිනිස් රුව



දොරවක ලෙන

**බිල්ලෑව ප්‍රාග් ඓතිහාසික  සිතුවම්**

- උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
- එස්. යූ. දැරණියගල විසින් 1951 වසරේ දී සොයා ගන්නා ලදී.
- බහු මාධ්‍යයෙන් නිම කළ චිත්‍ර ද හමු වී ඇත.
- කොටුවක් (නිවසක්) තුළ දක්වන මිනිස් රූප දෙකක් සහිත සිතුවම ජෝන් ස්ටීල්ට අනුව වැදගත් නිර්මාණයක් වේ.
- ඇත්, ගෝන සහ මොනර රූප මෙන්ම ජ්‍යාමිතික සංකේත සහිත රූපද මෙහි දැකිය හැකි ය.



සතෙකු පිට යන මිනිසා



සතෙකු පිට යන මිනිසා  පිටපත් කරන ලද සිතුවම



මොල්ලිය සහිත ගව රූව



මොල්ලිය සහිත ගව රූව පිටපත් කරන ලද සිතුවම



මිනිස් රූප සම්පිණ්ඩනය/කොටුවක් (නිවසක්) තුළ මිනිස් රූප



බිල්ලෑව ගුහාව